සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# චිත්‍ර කලාව - I

10 ශ්‍රේණිය කාලය පැය 1 යි

| නම/ විභාග අංකයඃ |
|---|

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා පහත සඳහන් රූප සටහන භාවිතයට ගෙන පිළිතුරු සපයන්න.



ඉහත සිතුවම (01) ................................................... විහාරයේ (02) ........................................................................

ශිල්පියා විසින් අඳින ලද්දකි. මෙම සිතුවම (03) ........................................................... ශිල්ප ක්‍රමයට ඇඳ

ඇති අතර නිතැතින් ගලායන (04) ................................................................ ගුණයෙන් යුත් රේඛාවෙන්

රූපවල පිරුණු බව මනාව ඉස්මතු කොට ඇත. මෙම ස්ථානයේ ඇති (05) ....................................................

චිත්‍රයේ සනිකවාදී හැඩතල නිසා එය සුවිශේෂී බවක් ගනී.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

06 ගම්පොළ යුගයේ දී ස්ථපතිරායර් ශිල්පියා විසින් ඉදිකරන ලද විහාරය කුමක් ද?

..........................................................................................................................................

07 ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ලෙන් විහාර අතරින් ලෙන් පහකින් සමන්විත එකම ස්ථානයක පිහිටි විශාලතම ලෙන් විහාරය කුමක් ද? ..................................................................................

08 යාපනයේ නල්ලූර්හි සට්ටනාදර් ශිව දේවාලයේ ඇති සුදු කුකුළා නැමති සිතුවම ඇඳි ශිල්පියා කවුරුන් ද?

..........................................................................................................................................

09 මිය ගිය ජේසුස් වහන්සේගේ අප්‍රාණික සිරුර මරියතුමී විසින් උකුලේ හොවා සිටින මූර්තියේ මාධ්‍යය කුමක් ද? ..............................

10 ඉසුරුමුණි කැටයම් අතර පෙම් යුවළ නම් අග්‍රගන්‍ය නිර්මාණය දැකිය හැක්කේ කුමන ස්ථානයක ද?

..............................

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 මහනුවර ප්‍රදේශයේ පිහිටි මැදවල විහාරය

(1) ගොඩනඟන ලද විහාරයකි. (2) ටැම්පිට විහාරයකි.

(3) ලෙන් විහාරයකි. (4) දැවමය විහාරයකි.

12 පිත්තල කර්මාන්තයේ භාවිත කරන ශිල්ප ක්‍රමය වන්නේ,

(1) ඇඹීම හා නෙළීම ය. (2) පට්ටල් වැඩ ය.

(3) නියපොතු සහ පට්ටල් වැඩ ය. (4) තලන වැඩ හා වාත්තු වැඩ ය.

13 කාන්තා සිරුරේ සුන්දරත්වය විදහා පෙන්වීම සඳහා ග්‍රීක ශිල්පීන් විසින් නිර්මාණය කරන අග්‍රගන්‍ය කලා කෘතියක් වන්නේ,

(1) නෙපර්ටිටි බිසවගේ මූර්තිය ය. (2) වීනස් දෙවඟනගේ මූර්තිය ය.

(3) නෝප්‍රෙට් බිසවගේ මූර්තිය ය. (4) තියඩෝරා රැජිනගේ මූර්තිය ය.

14 ඉන්දියාවේ මොහෙන්ජදාරෝ ශිෂ්ටාචාරයේ හරප්පාවෙන් හමුවූ නළඟන මූර්තියේ මාධ්‍ය වනුයේ,

(1) කළුගල් ය. (2) ලෝකඩ ය. (3) රතු වැලි ගල් ය. (4) හුණුගල් ය.

15 පැරණි විහාර චිත්‍ර ශිල්පීන් රතු වර්ණය සාදාගත්තේ,

(1) ගොකටු ගසේ කිරිවලිනි. (2) නිල් අවරිය පැළෑටියේ යුෂ වලිනි.

(3) පතඟි ගසේ කැබලි තම්බාගත් ජලයෙනි. (4) සාදිලිංගම් කුඩු විශේෂයකිනි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

16 පුනර්ජීවන යුගයේ නිර්මාණය කරන ලද මැඩෝනා ඩෙලාසේදියා සිතුවම .............................. ශිල්පියාගේ නිර්මාණයකි.

17 මුද්‍රා භාවිතයෙන් බුදු සිරිතේ වැදගත් අවස්ථා නිරූපණය කිරීමට උත්සාහ දැරූ චිත්‍ර ශිල්පීන් සිදුහත් තවුසා බුදුවූ අවස්ථාව නිරූපණය කිරීමට යෙදුවේ .............................. මුද්‍රාවයි.

18 ගඩලාදෙණි විහාරයේ බුද්ධ ප්‍රතිමාව නිර්මාණයේ දී .............................. ලක්ෂණවලට වඩා බාහිර ලක්ෂණ පෙන්වීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත.


19 සෝලියස් මැන්දිස් හා එම්. සාර්ලිස් ශිල්පීන් .............................. යුගයේ දී බුදු දහම ප්‍රවර්ධනය සඳහා චිත්‍ර නිර්මාණය කළ ශිල්පීන් ය.

20 ක්‍රිස්තු දහම අලලා තෙල් සායම් මාධ්‍යයෙන් චිත්‍ර සමූහයක් මහනුවර ත්‍රිත්ව දෙව් මැදුරේ නිර්මාණය කරන ලද්දේ ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පියෙකු වූ .............................. ශිල්පියා විසිනි.

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති රූප සටහන්වලට වඩාත්ම ගැලපෙන රූපය **A, B, C, D, E** රූප අතරින් තෝරා එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියේ ඇති තිත් ඉරමත යොදන්න.

21.  ..............................................  **A**


22.  ..............................................  **B**

23.  ..............................................  **C**

24.  ..............................................  **D**

25.  ..............................................  **E**

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පහත දී ඇති E, F, G, H, I යන රූප ඇසුරින් පිළිතුරු සපයන්න.**

|  |  |  |  |  |
|---|---|---|---|---|
| E | F | G | H | I |

26 E අක්ෂරයෙන් දැක්වෙන සිතුවම කුමන සියවස්වලට අයත්වේ ද? ..........................................................

27 F අක්ෂරයෙන් දැක්වෙන සිතුවම සොයාගන්නා ලද ස්ථානය කුමක් ද?

..........................................................................................................................

28 G අක්ෂරයෙන් දැක්වෙන කැටයමේ ශිල්ප ක්‍රමය කුමක් ද? ..........................................................

29 H අක්ෂරයෙන් දැක්වෙන රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද? ..........................................................

30 I අක්ෂරයෙන් දැක්වෙන මහනුවර සිංහල සැරසිලිවලට අයත් සැරසිල්ලෙන් සංකේතවත් වන්නේ කුමක් ද?

..........................................................................................................................

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති වචනයට අර්ථවත් වන ලෙස වාක්‍යයක් බැගින් ලියන්න.**

31 බයිසන් ගව රූපය ..........................................................

32 ටෙම්ප්ලේට් මුද්‍රණය ..........................................................

33 නිර්ජීව මෝස්තර ..........................................................

34 ක්ෂයවෘද්ධි ලක්ෂණ ..........................................................

35 අභය මුද්‍රාව ..........................................................

- ප්‍රශ්න අංක 35 සිට 40 දක්වා දී ඇති රූප සටහන අගයමින් වාක්‍ය පහක් අර්ථවත්ව ලියන්න.



36 හඳුනාගත් බව ..........................................................

37 ශිල්පියා ..........................................................

38 මාධ්‍යය ..........................................................

39 යුගය ..........................................................

40 ශිල්පීය කුසලතා ..........................................................

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# චිත්‍ර කලාව - II

10 ශ්‍රේණිය | කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- ★ ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ **පසු පිටේ** පැහැදිලි ව සටහන් කරන්න.
- ★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ★ දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- ★ සියලුම ද්‍රව්‍ය ඇස්මට්ටමින් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

---

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට, චිත්‍රය නිර්මාණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අවධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා වෙනත් කඩදාසියක් භාවිතා කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න.

★ මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

★ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- රේඛා අධ්‍යයනය
  1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේදී දක්වන කුසලතා
- වර්ණ චිත්‍රය
  2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
  3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
  4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම
  5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
  6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - III

කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති තීරුවේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (ෆේල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

---

### "අ" කොටස - ප්‍රකාශන

(1) හේන් හෝ කුඹුරු ගොවිතැනක නිරත ගොවීන් හා ගෙවිලියන් විඩාව සන්සිඳුවා ගනිමින් ඇඹුල ලබාගන්නා අවස්ථාවක්

(2) නෙට්බෝල් ක්‍රීඩාවක උණුසුම් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

(3) පන්සල් භූමියක මල් වෙළඳාමේ යෙදෙන මල් වෙළෙන්දන්/වෙළෙන්දියන් සහ බැතිමතුන්

(4) වනයේ ඇති වූ ගින්නක් නිසා කලබලයට පත්වූ වන සතුන්

### "ආ" කොටස - මෝස්තර නිර්මාණය

(5) නිර්මාණාත්මක සත්ත්ව හැඩතල ඇසුරින් සරොම් වාටියකට ගැලපෙන මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.

(6) සමන්පිච්ච මල හා කොළ යොදාගනිමින් චීත්ත රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්

(7) පොල්තෙල් පහනක් වටා බිම සැරසිලි කරන පලාපෙති මෝස්තරවලින් හැඩගැන්වූ අල්පනා මෝස්තරයක් නිර්මාණය කොට වර්ණ කරන්න.

### "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

(8) සත්ත්ව ලෝකය පිළිබඳව කියවෙන ළමා කතන්දර පොතකට පිටකවරයක් නිර්මාණය කර වර්ණ කරන්න.

(9) සිඟිත්තන්ගේ නිර්මාණ එළිදක්වීම සඳහා ප්‍රදර්ශනයක් නැරඹීම සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කර වර්ණ කරන්න.

(10) ''මහදනමුත්තා'' කතා පොතෙහි ඔබ සිත්ගත් අවස්ථාවක් දැක්වෙන ''සන්නි දර්ශන'' චිත්‍රයක් අඳින්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය (ලිඛිත)

| | | | |
|---|---|---|---|
| (01) ගෝතමී විහාරය | (02) ජෝර්ජ් කීට් | (03) ප්‍රෙස්කෝ සීකෝ | (04) ජීවමය |
| (05) මාර පරාජය | (06) ලංකාතිලක විහාරය | (07) දඹුල්ල විහාරය | (08) තාවඩ් මු තුරෙයිසාමි |
| (09) කිරිගරුඬ | (10) ඉසුරුමුණි කෞතුකාගාරය | | (11) II ටැම්පිට විහාරය |
| (12) IV තලන වැඩ, වාත්තු වැඩ | (13) වීනස් දෙවඟනගේ මූර්තිය | (14) ලෝකඩ | (15) සාදිලිංගම් කුඩු |
| (16) රෆායල් සෙන්සියෝ | (17) භූමි ස්පර්ශ මුද්‍රාව | (18) අධ්‍යාත්මික | (19) කොළඹ |
| (20) ඩේවිඩ් පේන්ටර් | (21) E | (22) D | (23) A |
| (24) B | (25) C | (26) පස්වන සියවස | |
| (27) මීඩම්හි මස්ටාබා වර්ගයට අයත් සොහොන්ගෙය | | (28) ඇම්බැක්ක දේවාලය | |
| (29) ශිවගේ එක් වේශයෙන් වන පශුපති | | (30) සදාකාලික බව / ස්ථිර බව | |

(31) ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් අතර බහුලව දැකිය හැකි සත්ත්ව රූපයකි.

(32) පැස්ටල් මාධ්‍ය භාවිත කර හැඩතලයක් කපා ඒ මත පැස්ටල් තවරා ඇඟිල්ලෙන් ඇතිල්ලීමෙන් නිර්මාණය කරන චිත්‍ර වේ.

(33) ජ්‍යාමිතික මෝස්තර නමින්ද හැඳින්වේ. / මහනුවර යුගයේදී විශේෂයෙන් දැකිය හැකිය. / පනාව, සුළිය, දියවැල, ගල් බිංදුව, අරිම්බුව, තනිපට ලණුව, දෙපට ලණුව ආදී මෝස්තර නිර්ජීවී මෝස්තර වේ.

(34) ඉදිරි පෙනුම කෙටිකර දක්වීමේ ක්‍රමය (ඉසුරුමුණි පොකුණේ ඇත් කැටයම, දේවාරාධනාව, තිවංක පිළිමගෙය)

(35) අවුකන පිළිමයේ දැකිය හැකිය. / බුද්ධ ප්‍රතිමාවල දකුණු අත්ල (අල්ල) ඉදිරියට පෙනෙන ආකාරයට දක්වීම

(36) මෙහි දක්වෙන්නේ හර්මීස් සහ ඩයොනීසස් නම් ග්‍රීක මූර්තියයි.

(37) මෙය ප්‍රැක්සි ටෙලස් නම් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද්දකි.

(38) කිරිගරුඬ මාධ්‍ය කොටගෙන නිර්මාණය කර ඇත.

(39) මෙම නිර්මාණය ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් වේ.

(40) මානව සිරුරේ රිද්මය, දරුවාගේ මොලකැටි බව, සමබරතාවය, රෙද්දෙහි කඩාහැලෙන ස්වභාවය මනාලෙස දක්වා ඇත. (ලකුණු $1 x 40 = 40$)

## II පත්‍රය - ස්වාභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය

**ලකුණු දීමේ නිර්ණායක :**

(1) ද්‍රව්‍ය අධ්‍යයනයේ දී නිදහස්ව, අර්ථවත්ව, රේඛාව හැසිරවීම - ලකුණු 05

(2) තලය අර්ථවත්ව හැසිරවීම - ලකුණු 05

(3) පරිමාණය හා ගති ස්වභාවය - ලකුණු 05

(4) සිද්ධාන්ත භාවිත අවබෝධය (පර්යාවලෝකය, ඝණත්වය, ඇස් මට්ටම) - ලකුණු 05

(5) වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම - ලකුණු 05

(6) සමස්ත නිමාව / පසුබිම දැක්වීම - ලකුණු 05

II වන පත්‍රය සඳහා හිමි ලකුණු - ලකුණු 30

### III පත්‍රය - "අ" කොටස - චිත්‍ර සංරචනය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේදී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශ කර ඇති අයුරු - ලකුණු 06
(2) මානව රූ හා සත්ව රූ ඇතුළු සියළු හැඩතල තල මත සම්පිණ්ඩනය කර ඇති අයුරු - ලකුණු 06
(3) සිද්ධාන්ත භාවිතය - ලකුණු 06
(4) වර්ණ භාවිතයේ කුසලතා - ලකුණු 06
(5) අනුමත ශෛලියට අනුව චිත්‍රයේ සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු - ලකුණු 30**

### III පත්‍රය "ආ" කොටස - මෝස්තර හා සැරසිලි නිර්මාණය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නව්‍යතාවයකින් යුතුව සැලසුම් කිරීම - ලකුණු 06
(2) පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව - ලකුණු 06
(3) නිර්මාණාත්මක හැකියාව හා තලය භාවිතය - ලකුණු 06
(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06
(5) විචිත්‍රත්වය, චමත්කාර බව, සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු - ලකුණු 30**

### III පත්‍රය "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවයෙන් සැලසුම් කිරීම. - ලකුණු 06
(2) වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06
(3) රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06
(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම. - ලකුණු 06
(5) විචිත්‍රත්වය, චමත්කාරය හා සමස්ත නිමාව. - ලකුණු 06

**මුළු ලකුණු - ලකුණු 30**

| | | | | |
|---|---|---|---|---|
| **(i)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| **(ii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| **(iii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |